පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

තෙවන වාර පරීක්ෂණය - 2023

ශ්‍රේණිය 09

විෂයය :- භූගෝල විද්‍යාව

පාසලේ නම : ....

ඇතුළත්වීමේ අංකය : ....

කාලය පැය 02

❖ **සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

- **ප්‍රශ්න අංක 1 සිට ප්‍රශ්න අංක 05 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න**

1. ආසියාවේ සාමාන්‍ය ජන ඝණත්වය වර්ග කිලෝමීටරයට .... කි.

   (100කි , 85කි , 87කි , 95කි)

2. පකිස්ථානයේ ප්‍රධාන කෘෂිකාර්මික සෘතු දෙක .... හා.................... ..වේ.

   (කාරිෆ් හා රාබී, යල සහ මැද, රාබී හා මැද, අකලහස සහ පිට දඩහස)

3. ‘Dubdi Mall’’ නමින් හැඳින්වෙන ලෝකයේ විශාලතම වෙළඳ මධ්‍යස්ථානය පිහිට රට................. වේ.

   (චීනය, ජපානය,ඩුබායි, අරාබිය)

4. ශ්‍රී ලංකාවේ පිහිටි සමනළ කඳු වැටියේ උස මීටර් .... වේ .

   (මීටර් 2237, මීටර් 2456, මීටර් 2257, මීටර් 2468)

5. වියලි කලාපයේ රළි බිම්වලින් ආරම්භවන ගංගා වර්ෂා කාලයේදී ගලා යන අතර වියලි කාලයේදී සිඳී යයි. එම ගංගා .... නමින් හඳුන්වයි.

   (වියළි ගංගා, සෘතුමය ගංගා, ගලායන් ගංගා, ප(ධාන ගංගා)

- **ප්‍රශ්න අංක 6 සිට ප්‍රශ්න අංක 10 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න**

6. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය කොපමණද

   1. සෙල්සියස් අංශක 27 2 .සෙල්සියස් අංශක 25
   3. සෙල්සියස් අංශක 22 4. සෙල්සියස් අංශක 29

7. ශ්‍රී ලංකාවට දෙවන අන්තර් මෝසම් වර්ෂාව ලැබෙන කාල සීමාව වන්නේ

   1. මාර්තු - අප්‍රේල් 2. ඔක්තෝම්බර් - නොවැම්බර්
   3. දෙසැම්බර් - ජනවාරි 4. මැයි - ජූනි

8. අර්ධ ශුෂ්ක කලාපයේ වාර්ෂික වර්ෂාපතනය දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ

1. 650 mm – 1250 mm
2. 700 mm – 1400 mm
3. 600 mm – 1200 mm
4. 900 mm – 1500 mm

9. කඩොලාන ශාක ව්‍යාප්තව ඇති ප්‍රදේශයක් **නොවන්නේ**

1. කලමැටිය
2. බූන්දල
3. මුතුරාජවෙල
4. කොඩිකාමම්

10. 2012 ජන සංඝණනයට අනුව ශ්‍රී ලංකාවේ වර්ග කිලෝමීටරයට සිටින පුද්ගලයන් සංඛ්‍යාව

1. පුද්ගලයන් 323
2. පුද්ගලයන් 325
3. පුද්ගලයන් 355
4. පුද්ගලයන් 340

- **ප්‍රශ්න අංක 11 සිට ප්‍රශ්න අංක 15 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති ප්‍රකාශය නිවැරදි නම් (✓) ලකුණද වැරදි නම් (✕) ලකුණද වරහන් තුළ යොදන්න.**

11. ශ්‍රී ලංකාවේ වයඹ ගිණිකොන දිශානුගතව විහිදෙන **රක්වාන** හා **බුළුතොට හෙල්** ශේෂ කඳු වේ. ( )
12. ශ්‍රී ලංකාවේ සමස්ත ජලවහන රටාව **අරීය ජලවහන රටාව** වේ. ( )
13. අධික ඉන්ධන දහනය හේතුවෙන් **පරිසරිය අසංතුළනය** වේ. ( )
14. **මොන්ට්‍රියල් සම්මුතිය** මගින් **තෙත් බිම් සංරක්ෂණය** පිළිබඳව සාකච්ඡා කරයි. ( )
15. ශ්‍රී ලංකාවේ නාගරික ජනතාවගේ **සාක්ෂරතාවය 95.6 %.** ( )

- **අංක 16 සිට 20 තෙක් දී ඇති (අ) කොටසේ ප්‍රශ්න සඳහා ගැලපෙන පිළිතුර (ආ) කොටසින් තෝරා නිවැරදි ඉංග්‍රිසි අක්ෂරය ඉදිරියේ ඇති තිත් ඉර මත ලියන්න**

අ කොටස		**ආ කොටස**
16. මහවැලි ගඟ මුහුදට වැටෙන ස්ථානය	…………….	A කුමන
17. ශ්‍රී ලංකාවේ ස්වාභාවික වර්ෂා වනාන්තරය	…………….	B මුතුරාජවෙල
18. ශ්‍රී ලංකාවේ දර්ශනීයම වගුරු බිම වන්නේ	…………….	C ත්‍රිකුණාමලය
19. ශ්‍රී ලංකාවේ පිහිටි කුරුලු අභය භූමියකි	…………….	D කොළඹ
20. ශ්‍රී ලංකාවේ වැඩිම ජනගහනයක් වාසය කරනු ලබන දිස්ත්‍රික්කකය වන්නේ	…………….	E සිංහරාජ වනාන්තරය

දෙවන කොටස

සැලකිය යුතුයි

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- අනෙකුත් ප්‍රශ්න අතුරින් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න
- පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව 05 කි.

1. (අ)



I. A අක්ෂරයෙන් දක්වා ඇති දේශාංශ රේඛාව නම් කරන්න
II. B අක්ෂරයෙන් දක්වා ඇති මුහුද නම් කරන්න
III. C අක්ෂරයෙන් දක්වා ඇති කඳු පංතිය නම් කරන්න
IV. D අක්ෂරයෙන් දක්වා ඇති ගංගාව නම් කරන්න
V. ජපන් දූපත් නම් කර ඇති අක්ෂරය ලියන්න

(ලකුණු 2 ×5 = 10)

(ආ)

1: 50000 හු ලක්ෂණ සිතියම් හි භාවිත කරනු ලබන සම්මත සලකුණු , නිවැරදි සංකේත හා වර්ණ භාවිතයෙන් පහත සඳහන් සලකුණු ඇඳ දක්වන්න.

I. දිස්ත්‍රික් මායිම
II. පාසල
III. ප්‍රදීපාගාරය
IV. තේ වගාව
V. ලඳු කැලෑ (ලකුණු 2 ×5 = 10

2. I. ආසියානු කලාපයට අයත් ප්‍රමාණයෙන් විශාල දූපත් රාජ්‍යයන් දෙකක් ලියන්න (ලකුණු 02)

II. ආසියාවේ භෞතික භූ දර්ශනයේ දක්නට ලැබෙන පහත සඳහන් භූ විෂමතා ලක්ෂණ සඳහා උදාහරණ එක බැගින් ලියන්න

- කඳු වැටි ……………………………
- සානු ……………………………
- තැනිතලා ……………………………

(ලකුණු 03)

III. ආසියානු කලාපයේ ආර්ථික ක්‍රියාකාරකම් අතර කෘෂිකාර්මික රටක් වශයෙන් පකිස්ථානයේ වැදගත්කම් 03ක් ලියන්න ඉන් එකක් පැහැදිලි කරන්න (ලකුණු 05)

3. I. වෙරළබඩ තැනිතලාව ආශ්‍රිතව දක්නට ලැබෙන භූ විෂමතා ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

II. උෂ්ණත්ව ව්‍යාප්තියේ වෙනස්කම්වලට බලපාන සාදක 03ක් ලියන්න (ලකුණු 03)

III. ශ්‍රී ලංකාවේ ජනාවාස වර්ග 03 නම් කර ඉන් එක්ජනාවාසයක් පිළිබඳ විස්තර කරන්න (ලකුණු 05)

4. I. ඔබට සපයා ඇති ලංකා අකෘතික සිතියමේ යාපනය අර්ධද්වීපය සහ කඳුකර කලාපය ලකුණු කර නම් කරන්න (ලකුණු 02)

II. වෙරළබඩ කලාපයේ මානුෂ භූ දර්ශනය ආශ්‍රිතව දක්නට ලැබෙන කර්මාන්ත 03ක සඳහන් කරන්න (ලකුණු 03)

III. කඳුකර කලාපය තුළ සංචාරක ආකර්ෂණය වැඩිවීමට බලපාන හේතු තුනක් සඳහන් කර ඉන් එකක් විස්තර කරන්න (ලකුණු 05)



5. I. ශ්‍රී ලංකාවට මෝසම් වර්ෂාව ලැබෙන ක්‍රම දෙක නම් කරන්න (ලකුණු 02)

II. පතන සීඝ්‍රතාවය යනු කුමක් ද විස්තර කරන්න (ලකුණු 03)

III. ශ්‍රී ලංකාවේ ස්වාභාවික වෘක්ෂ ලතා කලාප තුනක් නම් කර ඉන් එක් කලාපයක සුවිශේෂතාවය විස්තර කරන්න (ලකුණු 05)

6. I. ලෝකයේ රටවල් සංවර්ධනය දැක්වීම සඳහා විවිධ දර්ශක යොදාගනී, එම සංවර්ධක දර්ශක අතුරින් දෙකක් සඳහන් කරන්න (ලකුණු 02)

   II. මාතෘ මරණ අනුපාතිකය ගණනය කරනු ලබන ආකාරය ලියන්න (ලකුණු 03)

   III. ශ්‍රී ලංකාවේ 2010 වර්ෂයේ දිස්ත්‍රික්ක අනුව වැඩිම ළදරු මරණ අනුපාතයක් දක්නට ලැබෙන දිස්ත්‍රික්ක 03ක් ලියන්න. ළදරු මරණ අනුපාතය යනු කුමක් ද යන්න විස්තර කරන්න (ලකුණු 05)

7. I. වනාන්තර විනාශය හේතුවෙන් පරිසරයට ඇති කරන බලපෑම් දෙක්ක ලියන්න (ලකුණු 02)

   II. පරිසර තුළිතතාවය ආරක්ෂා කර ගැනීම සඳහා ජාතික හා ජාත්‍යයන්තර වශයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග 03ක් සඳහන් කරන්න (ලකුණු 03)

   III. පරිසර ආචාර ධර්ම යනු කුමක්ද යන්න විස්තර කර පරිසර ආචාර ධර්මවල අවශ්‍යතාවය පැහැදිළි කරන්න (ලකුණු 05)

භූගෝල විද්‍යාව

9 ශ්‍රේණිය

උතුරු මැද පළාත - තෙවන වාර පරීක්ෂණය

පිළිතුරු පත්‍රය :

1 කොටස

01 : 87 කි

02 : කාරි සහ රාබී

03 : ඩුබායි

04 : 2237 මීටර්

05 : සෘතුමය ගංගා

06 : 27 සෙල්සියස්

07 :ඔක්තෝම්බර් - නොවැම්බර්

08 : 650 mm- 1250 mm

09 : කොඩිකාමම්

10 : 323

11 : වැරදි

12 : නිවැරදි

13 : නිවැරදි

14 : වැරදි

15 : වැරදි

16 : C

17 : E

18 : B

19 : A

20 : D

දෙවන පත්‍රය

01) (අ) 1 : ජාත්‍යන්තර දින රේඛාව

2 : කැස්පියන් මුහුද

3 : යූරල් කඳු

4 : ඉන්දු ගඟ

5 : E

(ආ) නිවැරදි සංකේත හා වර්ණ යොදා තිබේ නම් ලකුණු ලබා දෙන්න

02 : 1 ජපන් දූපත්

ඉන්දුනීසියාව

පිලිපීනය

ශ්‍රී ලංකාව

තායිවානය

2 : 01 : අල්තායි, කුන්ලුන්, කාරකෝරම්, (පිටු අංකය 05)

02 : ටිබෙට් සානුව, පාමීර්, ඩෙකෑන් සහ මධ්‍යම සයිබීරියාව

03 : බටහිර සයිබිරියාව සහ මැංචූරියා තැන්න

3 : විශාල වාරිමාර්ග පද්ධතියක් පිහිටා තිබීම

කෘෂි නිෂ්පාදන ලෝක වෙළඳපළට ලබා දීම

අමු කපු සපයන ප්‍රධාන රට වේ

03 : 1 බොකු, කලපු, තුඩු, මෝය, වෙරළ දඹ සහ දූපත්

02 : ඉන්දියානු උපමහද්වීපයට ආසන්නව බිහිවීම

මුහුදේ සිට ඇති දුර

වෙනස්වන සුළං රටාව

3 : ග්‍රාමීය , ගැමි සහ ගැමි නාගරික

පිටු අංක 55 විස්තරය

4 1 : පිටු අංක 62 සහ 63

2 : ධීවර, කොහු, හුණුගල්, ලුණු සහ සංචාරක කර්මාන්තය

3 : සුවිශේෂී වූ භූ විෂමතාවය

දේශගුණය සහ පාරිසරික සුන්දරත්වය ආදි කරුනු විස්තර කර ලියා තිබීම

5 1: ඊසාන දිග මෝසම

ණිරිත දිග මෝසම

2 : භූමි මට්ටමේ සිට ඉහළ යන සෑම මීටර් 100කටම උෂ්ණත්වය සෙල්ශියස් අංශක 0.64 කින් පහත

නැටීම

3. පහත් රට තේත , පහත රට වියළි මිශ්‍ර සදාහරිත, අතර මැදි සදාහරිත, කඳුකර තෙත්, කඳුකර වියළි , කටපදුරු හා ළඳු කැලෑ , කඩොලාන,

(පිටු 41 සිට 49)

6 1: ඒක ශිර්ෂ ආදායම, ළදරු මරණ අනුපාතය, උපතේදී ආයු අපේක්ෂාව, සාක්ෂරතාවය,

2 : සජීවී උපත් 1000කට දළ උපත් අනුපාතිකය,

3 : මඩකලපුව, නුවර එළිය, කොළඹ

(පිටුව 69)

07 1 : වෘක්ෂ ලතා හා වනජීවීන් විනාශ වීම

ජල මූලාශ්‍රය

2 : (81 පිටුවේ දක්වා ඇති විස්තරය)

3 : පරිසරය යහපත්ව පවත්වාගෙන යාම සඳහා අවශ්‍යවන සාරවත්ව යහපුරුදු පරිසර ආචාර ධර්ම

ලෙස හැදින්විය හැකිය (80 පිටුව)

LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න